මාධ්‍ය නිවේදනය
කොළඹ, 2017 ජුනි 14

Good Food, Good Life

# මයිලෝ, 25 වසරක පාසල් රග්බි අනුග්‍රහකත්වය සමරයි

'Legends Rugby Showdown' තරඟාවලියක් සඳහා රට පුරා විසිරී සිටින ජ්‍යෙෂ්ඨ රග්බි ශූරයින් කැඳවයි

මයිලෝ, 25 වන සංවත්සරය සැමරුමට සමගාමීව පවත්වන 'Legends Rugby Showdown' තරඟය, මෙරට රග්බි ලෝලීන්ට අමතක නොවන අත්දැකීමක් වනු නොඅනුමානයි. වසරේ තරඟාවලිය ලෙස නම් කල හැකි මෙය, පාසල් රග්බි ක්‍රීඩාව සඳහා මයිලෝ හි අනුග්‍රහකත්වය දැක්වීමට වසර 25ක් පිරීමේ නිමිත්තෙන්, පෙර පැවැති මයිලෝ ජනාධිපති කුසලාන රග්බි තරඟාවලියන්හිදී ජයගහණය කල පාසල් කණ්ඩායම්වල නායකයින් සහ රග්බි තරු 25කගේ සහභාගීත්වයෙන් පැවැත්වේ. එහිදී සුහද රග්බි තරඟයක් පැවැත්වීමට නියමිතයි. ශ්‍රී ලංකා පාසල් රග්බි පාපන්දු සංගමය, අධ්‍යාපන අමාත්‍යාංශය සහ නෙස්ලේ සමාගම එකට එක්ව මෙය සංවිධානය කරනු ලබන අතර, පාසල් රග්බි ඉතිහාසයේ මෙවැනි තරඟයක් පැවැත්වෙන පළමු අවස්ථාව ලෙස ද සලකනු ලැබේ.

මෙහිදී රග්බි ශූරයන් '*Milo Whites*' සහ '*Milo Greens*' යනුවෙන් කණ්ඩායම් දෙකකට බෙදී තරඟ කරනු ඇත. තරඟයේ තීරකවරයා, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම තීරකවරයා ලෙස සැලකෙන ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා වන අතර මෙවර මයිලෝ ජනාධිපති කුසලාන රග්බි තරඟාවලිය 'Legends Rugby Showdown' තරඟයෙන් ආරම්භ වනු ඇත.

මෙම සුවිශේෂී අවස්ථාව පිළිබඳ අදහස් දක්වමින් නෝමන් කන්නන්ගර මහතා, නෙස්ලේ සමාගමේ උප සභාපති - පාන වර්ග, මෙසේ පැවසීය. "රග්බි ක්‍රීඩාවට සැබෑ ආදරයක් සහ ඇල්මක් ඇති සෑම රසිකයෙකුටම මේ තරඟය අමතක නොවන අත්දැකීමක් වේවි. පාසල් රග්බි ක්‍රීඩාව සහ අප අතර තියෙන අවුරුදු 25ක බැඳීම සැමරීමට මෙයට වඩා තවත් සුදුසු ආකාරයක් නැති බවයි අපේ හැඟීම. අපගේ අභිලාශය සෑමවිටම වන්නේ 'fuelling the winning spirit'. ඒ නිසා, මීට පෙර සිටි දක්ෂ රග්බි ක්‍රීඩකයින්, ඒ කාලයේ ක්‍රීඩා කළ ආකාරය පෙන්වා දීම හැර, තරුණ දක්ෂ ක්‍රීඩකයන් දිරිගැන්වීමට වඩා හොඳ ක්‍රමයක් තවත් තියේද? මෙම සංවත්සර තරඟාවලිය, පසුගිය අවුරුදු 25 තුළ අප විසින් රග්බි තාරකාවන් ගොඩනැංවීමේ විශේෂ අවස්ථාවක් වන අතර, මෙය රග්බි ක්‍රීඩකයින්ගේ ඉදිරි පරම්පරා වලට ධෛර්යය සහ යහපත ඇතිකිරීමට අප දරන වෑයමේ අවස්ථාවක් ලෙස ද හැඳින්විය හැකියි".

මයිලෝ රග්බි 25 වැනි සංවත්සරය සැමරීමට පූර්වගාමීව, කණ්ඩායම් හැඟීමේ ඇති වැදගත්කම අවධාරණය කිරීම සඳහා මෙම පාසල් රග්බි තරු, මයිලෝ සමඟ අත්වැල් බැඳගෙන තිබේ. ඒ අනුව '#TeamMakesMe' යන තේමාව යටතේ, ඔවුන් ක්‍රීඩාපිටිය තුළදී මුහුණ දුන් අභියෝග හා හොඳම අත්දැකීම් සිහිපත් කරන වීඩියෝ දර්ශන මාලාවක්, සමාජ මාධ්‍ය ජාලා, ගුවන් විදුලිය හා රූපවාහිනිය යන මාධ්‍ය ඔස්සේ විකාශය වේ.

මෙම තරඟයට තවත් ජීවයක් එක් කරමින්, රග්බි ලෝලීන්ට තමන් කැමැති ක්‍රීඩකයාට මනාපය පළ කළ හැකි ආකාරයේ යෙදුමක් (App) හඳුන්වාදීමට ද මයිලෝ පියවර ගෙන

තිබේ. ඒ අනුව මයිලෝ ශ්‍රී ලංකා ෆේස්බුක් පිටුවට (www.facebook.com/MiloSriLanka) පිවිසීමෙන් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් (777 68 00 77) එම යෙදුමට (App) ප්‍රවේශ විය හැක.

මෙම සුවිශේෂී තරගය ජූනි 24 වැනිදා කොළඹ රේස්කෝස් රග්බි පිටියේදී පස්වරු 5.00ට ආරම්භ වීමට නියමිතය.

නෙස්ලේ සමාගමේ ජනප්‍රියතම පෝෂණීය පානයවන මයිලෝ, දශක තුනක් පුරාවටම පාසල් ක්‍රීඩා ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් ඉදිරියෙන්ම සිට කටයුතු කර තිබේ. ශ්‍රී ලාංකික කිරි ගොවීන් 20,000 කට ආසන්න සංඛ්‍යාවකගෙන් මිලදී ගන්නා නැවුම් කිරි යොදාගනිමින් නිපදවන මයිලෝ පානය, මෝල්ට් යහගුණයෙන් පරිපූර්ණ වන අතර එහි අඩංගු හොඳම කොකෝවා භාවිතය මගින් චොකලට් මෝල්ට් රසයක් ලබා දෙයි.

---

'Legends Rugby' කණ්ඩාම් සාමාජිකයින්

<u>*Milo* Whites කණ්ඩාම</u>

- සංජීව අබේගුණවර්ධන, ශාන්ත පීතර විදුහල් නායක, 1995 (නායක)
- වජිර හේවගේ, ඉසිපතන විදුහල් නායක, 1997
- ජනක ද සිල්වා, ඉසිපතන විදුහල් උප නායක, 1999
- රංග පෙරේරා, ඉසිපතන විදුහල් නායක, 2001
- දිනේෂ් සිරිවිමල, කිංස්වුඩ් විදුහල් නායක, 2003
- එරන්ද වීරක්කොඩි, කිංස්වුඩ් විදුහල් නායක, 2005
- ශානක ගුණසේකර, ශාන්ත පීතර විදුහල් උප නායක, 2007
- ජනික් ජයසූරිය, ශාන්ත තෝමස් විදුහල් උප නායක, 2009
- දුමින්ද ආටිගල, රාජකීය විදුහල් නායක, 2010
- මුරාඩ් රම්සීන්, ත්‍රිත්ව විදුහල් නායක, 2011
- ගැවින් සීගට්ස්, වෙස්ලි විදුහල් උප නායක, 2013
- ලසිඳු කරුණාතිලක, විද්‍යා විදුහල් නායක, 2015

*Milo* Greens කණ්ඩායම

- බන්දුල මල්ලිකාරච්චි, ඉසිපතන විදුහල් නායක, 1996 (නායක)
- විනෝත් කුරුප්පුනවෙල, තර්ස්ටන් විදුහල් උප නායක, 1998
- චාමර විතානගේ, කිංස්වුඩ් විදුහල් නායක, 2000
- සුල්කි හමීඩ්, රාජකීය විදුහල් නායක, 2002
- ෆාසිල් මරීජා, කිංස්වුඩ් විදුහල් නායක, 2004
- හරේන්ද්‍ර ආරියවන්ස, ශාන්ත පීතර විදුහල් නායක, 2006
- පූර්ණක දැල්පච්ත්‍රි, ශාන්ත පීතර විදුහල් නායක, 2008
- කීත් ගුරුසිංහ, ශාන්ත පීතර විදුහල් නායක, 2010
- ශෙනාල් ඩයස්, ඉසිපතන විදුහල් උප නායක, 2012
- සෙනාල් දීලක, ඉසිපතන විදුහල් නායක, 2014
- කුෂාන් ඉඳුනිල්, ඉසිපතන විදුහල් නායක, 2016

තරඟ තීරක

- ඩිල්රෝයි ප්‍රනාන්දු